සැ. යු. - (i) මෙවර පළවන *ගැසට්* පත්‍රයේ VI කොටසේ 2022 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

(ii) 2022.04.29 දින පළ වූ අංක 2278 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,279 - 2022 මැයි මස 06 වැනි සිකුරාදා - 2022.05.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 658 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 659 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 660 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මැයි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මැයි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

සංශෝධනයයි

MOD/DEF/ HRM /01/V/COM/CDT/20(11).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

අංක 2,218 දරන 2021.03.05 දින *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 03-121/24 යටතේ පළ වූ දැන්වීමෙහි "කාන්නා කෙඩෙට් නිලධාරි ගල්ගමුව මුදියන්සේලාගේ සංජීව සුපුන් ශානක-කපිතන් (ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය)" යනුවෙන් වැරදියට පළ වී ඇති බැවින්,

එම නිවේදනයෙහි එම නිලධාරියාගේ තනතුර හා නම "කෙඩෙට් නිලධාරි" දළුගම මුදියන්සේලාගේ සංජීව සුපුන් ශානක" යනුවෙන් නිවැරදි විය යුතුය.

පී.එන්. ගොඩැල්වත්ත යූ. එස්. පී.,
බ්‍රිගේඩියර්,
මූලික මාණ්ඩලික නිලධාරි,
සේනාවිධායක ශ්‍රීලංයුහසෙව්බමු *වෙනුවට*.

2022 අප්‍රේල් මස 19 වැනි දින,

05 - 61

---

MOD/DEF/HRM/04/SLN/DIS/2020/(06).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බළකාය**

සිය නිල කටයුතු ඉටුකිරීමේ විෂයෙහි නැවත පිහිටුවීම

පහත නම සඳහන් නිලධාරියා 2020 නොවැම්බර් මස 21 වැනි දින සිට සිය නිල කටයුතු ඉටුකිරීමේ විෂයෙහි නැවත පිහිටුවනු ලැබේ.

ලුතිනන් කොමාණ්ඩර් විජේසිංහලාගේ නිහාල් ලක්ෂමන් විජේසිංහ, එන්ආර්එක්ස් 2289, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

05 - 41/1

2022 අංක 338

MOD/DEF/HRM/04/SLN/RES/22/(08).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2022 අප්‍රේල් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බළකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් (වී) සුමිත් අනුරුද්ධික පෙරමුණ, එන්ආර්එල් 2510, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 මාර්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

05 - 41/2

---

2022 අංක 339

MOD/DEF/HRM/04/SLN/RES/22/(10).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2022 අප්‍රේල් මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බළකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නීති සේවා) බස්නායකගේ සුනෙත් ඉරෝෂාන් බස්නායක, එන්ආර්ජ් 3711, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

05 - 41/3

2022 අංක 340

MOD/DEF/HRM/04/SLN/RES/22/(12).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2022 මැයි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බළකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

උප ලුතිනන් (ස්වේ) තලවින්නේ ගෙදර ඉන්දික ප්‍රභාත් අමරනායක, එන්වීඑක්ස් 5824

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

05 - 41/4

---

# වෙනත් පත් කිරීම් ආදිය

2022 අංක 341

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය පිහිටුවීම සහ ඊට අදාළ කරුණු පිළිබඳ පනත යටතේ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ උපදේශණ හා සම්බන්ධීකරණ මණ්ඩලය සඳහා සාමාජිකයෙකු පත් කිරීම.

1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය පිහිටුවීම සහ ඊට අදාළ කරුණු පිළිබඳ පනතේ 5(2) (b)(iv) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විශ්‍රාමලත් සර්වේයර් ජනරාල්, අඹවල ලියනගේ ශ්‍යාමලි චිත්‍රලේඛා පෙරේරා මහත්මිය 2021.10.12 දින සිට බල පැවැත්වෙන පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ උපදේශන හා සම්බන්ධීකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 18 වැනි දින කොළඹ දී ය.

05 - 42

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කොටහේන ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

කිට්නසාමි ගංගාදරන්.

2020 දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 5727 හා 2017.10.04 දින දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම ණයකරු වශයෙන් කිට්නසාමි ගංගාදරන් විසින් පැහැර හැර ඇති අතර, ඒ අනුව එකී බැඳුම්කරය මත ඔබ වෙත ප්‍රදානය කරන ලද නිවාස ණය පහසුකම මත 2020 අගෝස්තු 30 වැනි දිනට අයවිය යුතුව ඇති රු. 25,061,305.47 (රුපියල් මිලියන විසි පහයි හැට එක් දහස් තුන්සිය පහයි ශත හතලිස් හතක) මුදලක් පමණක් ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව 2020 අගෝස්තු මස 31 වැනි දින සිට වික්‍රිණුම් දිනය දක්වා තවදුරටත් පොළිය ද සමග එකී රු. 25,061,305.47ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද, ගෙවීම් (ඇත්නම්) අඩුකොට අයකරගැනීම සඳහා එකී අංක 5727 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කර ඇති සහ මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය, කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාවේ, වසම් අංක 38 (බම්බලපිටිය) හි බම්බලපිටිය කොට්ඨාසය තුළ ඇල්ෆ්‍රඩ් හවුස් ගාඩ්න් දිගේ බම්බලපිටියේ පිහිටි වරිපනම් අංක 10 12/5, ඇල්ෆ්‍රඩ් හවුස් ගාර්ඩින්ස් දරන සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ දොළොස්වන මහලේ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් සාදන ලද අංක 1966 සහ 1999 ඔක්තෝබර් 02 දින දරන සහාධිපත්‍ය පිඹුරේ ලොට් 67 ඒකක 67 වශයෙන් ලකුණු කර ඇති නේවාසික සහාධිපත්‍ය ඒකකයට මායිම් වශයෙන්, උතුරට : මෙම ඒකකය සහ කොරිඩෝව සහ ඩී 12 එම් වශයෙන් ලකුණු කර ඇති නලය වෙන්කරන මෙම ඒකකයේ උතුරු බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම ඒකකය සහ ඒකක 66 ලොට් 66 සහ ඩී 12 එම් වශයෙන් ලකුණු කර ඇති නලය වෙන්කරන මෙම ඒකකයේ නැගෙනහිර බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම කොටසේ දකුණු බිත්තියේ මධ්‍යය සහ මෙම ඒකකය සහ ඩී12 එම් වශයෙන් ලකුණු කර ඇති නලය වෙන්කරන මෙම ඒකකයේ දකුණු බිත්තියේ මධ්‍යය ද, බස්නාහිරට : මෙම ඒකකය සහ ඒකක 68 ලොට් 68 සහ ඩී 12එල් වශයෙන් ලකුණු කර ඇති නලය වෙන්කරන මෙම ඒකකයේ බස්නාහිර බිත්තියේ මධ්‍යය ද, මුදුනට : වහල උද්‍යානයේ මධ්‍යය ද පහළට : මෙම ඒකකයේ බිමේ මධ්‍යය ද මායිම් එකී අංක 1966 දරන පිඹුර ප්‍රකාරව වූ වර්ග අඩි එක් දහස් හාරසිය හැට හතරක් (ව. අ. 1,464) හෝ වර්ග මීටර් එකසිය තිස් හයක් (ව. මී. 136) විශාලත්වයෙන් යුත් බිම් ප්‍රමාණය වේ. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් කොන් ඊ 56/25 යටතේ ලියාපදිංචි කර තිබේ.

මෙම ඒකක 67 ලොට් 67ට අයත් සහාධිපත්‍ය දේපළේ පොදු උපාංගවල නොබෙදූ කොටස් වටිනාකම 01.19% වේ.

ඒකක 67 ලොට් 67 සඳහා අනන්‍ය ලෙස පාවිච්චි කිරීමට වෙන්කරන ලද පීඑල් 39 වශයෙන් ලකුණු කරන ලද වාහන ගාල් කිරීමේ ඒකකය ද සමග වේ.

### දෙවන උපලේඛනය

සහාධිපත්‍ය දේපළේ පොදු උපාංග

2003 අංක 39 දරන මහල්නිවාස අයිතිය පිළිබඳ නීතිය (සංශෝධන) පනතින් සහ 1982 අංක 45 දරන (සංශෝධන) පනතේ 12 වන වගන්තිය මගින් සංශෝධනය කරන ලද පරිදි, 1973 අංක 11 මහල් නිවාස අයිතිය පිළිබඳ නීති පනතේ 26 වගන්තියේ දක්වා ඇති පරිදි සහාධිපත්‍ය දේපළේ ව්‍යවස්ථාපිත පොදු උපාංග

බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් සාදන ලද අංක 1966 හා 1999 ඔක්තෝබර් 02 වැනි දින දරන එකී සහාධිපත්‍ය පිඹුරේ නිරූපණය කර ඇති සහ විස්තර කර ඇති පොදු උපාංග වන, ඉඩමට සහ ගොඩනැගිල්ලට අයත් කොටස්

1. (අ) ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම.
   (ආ) මෙම ඉඩමේම ඉතිරි කොටස

2. අත්තිවාරම්, කණු, බාල්ක, ආධාරක, කාණු, කසළ කාණු, කාණු කවාට, ට්‍රාන්ස්පෝමරයේ සිට මීටර් දක්වා විදුලි රැහැන්, පොම්පය, වතුර නළ, ඉහළින් ඇති ටැංකි, මීටර් දක්වා වතුර පයිප්ප මාර්ගය, සෝපාන ප්‍රවේශ ශාලා, පඩිපෙළවල්, වාහන ගාල් කිරීමේ ඒකක මගින් ආවරණය වන ප්‍රදේශ හැර, ඒකක 1 ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද පහල බිම් මහල යන ඒකක 2 ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද ඉහල බිම් මහල, නළ, ගිනි නිවන උපකරණ,

යන්ත්‍ර කාමර, කොරිඩෝ, ආරක්ෂක කාමර, ට්‍රාන්ස්ෆෝමරය, පොම්පාගාරය, ජෙනරේටරය සහ කාමරය, වැසිකිළි ඇන්ටනා, අන්තර් සන්නිවේදන පද්ධතිය, වහල උද්‍යානය සහ මායිම් තාප්ප.

3. ඉහල විස්තර කරන ලද ප්‍රදේශ හැර ගොඩනැගිල්ලේ අනෙකුත් සියලුම ව්‍යුහයන්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති)/ මාණ්ඩලික ලේකම්.

05 - 16/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොටහේන ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

කිට්නසාමි ගංගාදරන්.

2020 දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් ලියා සහතික කරන ලද අංක 2970 හා 2017.03.29 දින දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම ණයකරු වශයෙන් කිට්නසාමි ගංගාදරන් විසින් පැහැර හැර ඇති අතර, ඒ අනුව එකී බැඳුම්කරය මත ඔබ වෙත ප්‍රදානය කරන ලද වාරික ණය පහසුකම් මත 2020 අගෝස්තු 30 වැනි දිනට අයවිය යුතුව ඇති රු. 14,990,406.74 (රුපියල් මිලියන දහහතරයි නම ලක්ෂ අනූ දහස් හාරසිය හයයි ශත හැත්තෑ හතර)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව 2020 අගෝස්තු මස 31 වැනි දින සිට විකුණුම් දිනය දක්වා තවදුරටත් පොළිය ද සමග එකී රු. 14,990,406.74ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද, ගෙවීම් (ඇත්නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2970 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කර ඇති සහ මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය, කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාවේ, වසම් අංක 43හි වැල්ලවත්ත දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වැල්ලවත්තේ පිහිටි වරිපනම් අංක 145/1 - ගාලු පාර දරන "කැලැන්කඩුවවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. වී. හෝප්මන් විසින් සාදන ලද අංක 38/1981 හා 1981 ඔක්තෝබර් 04 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 943 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 22වයි ද, නැගෙනහිරට : ලොට් 944 ද, දකුණට : ලොට් 947 ද සහ බස්නාහිරට : ලොට් 947, එක්ස් 2 සහ එක්ස් 1 ද මායිම් වූ එකී අංක 38/1981 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහයි දශම හයයි හය (පර්. 5.66)ක විශාලත්වයෙන් යුත් ඉඩම සමග ගොඩනැගිලි ඇතුලු එහි පිහිටි සෑම සියලු දේද වේ. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම වැල්ල 111/88 යටතේ ලියාපදිංචි කර තිබේ.

ඉහත කී අංක 2970 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති අංක 38/1981 දරන එකී පිඹුරේ ලොට් 947 මතින් හා ඒ දිගේ වන මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති)/ මාණ්ඩලික ලේකම්.

05 - 16/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - පිළියන්දල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

ජයවීර කුරුප්පුලාගේ සුනිල් නිලවීර.

2021 මැයි 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ජයවීර කුරුප්පුලාගේ සුනිල් නිලවීර වෙත ප්‍රදානය කරන ලද රු. 10,000,000.00ක වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 9339 හා 2013.02.12 දින දරන, අංක 10283 හා 2014.03.10 දින දරන, අංක 10285 හා 2014.03.10 දින දරන අංක 11160 හා 2016.04.25 දින දරන සහ අංක 11404 හා 2017.04.27 දින දරන සහ පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කර ලද අංක 6615 හා 2020.10.21 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ ණයකරු වශයෙන් ජයවීර කුරුප්පුලාගේ සුනිල් නිලවීර විසින් උකස්කර බැඳ තබා තිබේ.

තව ද, එකී ජයවීර කුරුප්පුලාගේ සුනිල් නිලවීර විසින් එකී බැඳුම්කර මත සහ රු. 10,000,000.00ක එකී වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව එකී බැඳුම්කර මත 2021 මාර්තු 12 වැනි දිනට රුපියල් මිලියන දහයයි එක් ලක්ෂ විසි එක් දහස් පන්සිය එකයි ශත තිස් හයක (රු. 10,121,501.36)ක මුදලක් දැන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව රු. 10,000,000.00ක ප්‍රාග්ධන හිඟය මත 2021 මාර්තු මස 13 වැනි දින සිට විකුණුම් දිනය දක්වා වර්ෂයකට 8.83%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමඟ එකී රු. 10,121,501.36ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ මුදල් ලැබෙන තුරු දරන ලද අනෙකුත් ගාස්තු, ගෙවීම් (ඇත්නම්) අඩුකොට අයකරගැනීම සඳහා එකී අංක 9339, 10283, 10285, 1160, 11404 සහ 6615 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැනක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ 577ඒ - වේරහැර දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ වේරහැරේ පිහිටි සහ වරිපනම් අංක 145/32 - 10 වන සැතපුම් කණුව පාර දරන 'දෙල්ගහවත්ත' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. අහංගම විසින් සාදන ලද අංක 3566 හා 1985 දෙසැම්බර් 23 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1ඩී (බලයලත් මිනින්දෝරු ඩබ්. අහංගම විසින් සාදන ලද අංක 1253 හා 1969 මැයි 28 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 හි කොටසක් මැනීමකි) වශයෙන් දක්වා ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වේරස් ගඟ පාර ද, නැගෙනහිරට : එකී අංක 1253 දරන පිඹුරේ ලොට් 5 (මාර්ගය සඳහා වෙන්කිරීම) ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්. අහංගම විසින් සාදන ලද අංක 3022 හා 1985 ජූලි 26 දින දරන පිඹුරේ ලොට් 1බී ද සහ බස්නාහිරට : එකී 3022 දරන පිඹුරේ ලොට් 1ඒ ද මායිම් වූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

එකී අංක 1253 දරන පිඹුරේ ලොට් 05 වශයෙන් ලකුණු කර ඇති මාර්ගය සඳහා වෙන්කිරීම හරහා සහ ඒ දිගේ වන මාර්ග අයිතිය සහ අනිකුත් අයිතීන්ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති)/ මාණ්ඩලික ලේකම්.

05 - 16/3

---

### යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 ජනවාරි මස 31 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මොරටුව, කල්දේමුල්ල පාර, අංක 64/4 සහ මොරටුව, කල්දේමුල්ල පාර, අංක 82/4 දරන ලිපිනයන්හි පදිංචි කන්කානම් කපුගේ ලිවින්ස්ටන් දහනායක (ජාතික හැඳුනුම්පත් අංක 711993495 V දරන) සහ ටෙරීන් ඉරේෂා පීටර්ස් (ජාතික හැඳුනුම්පත් අංක 788232136 V දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායින්" වශයෙන් හඳුන්වන) විසින් සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676 PQ දරන යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී) (මෙහි මින්මතු යූනියන් බැංකුව වශයෙන් හඳුන්වන,) වෙතින් ණය පහසුකමක් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාරව සහ ඊට යටත්ව පිළිවෙලින් රුපියල් 5,350,000.00ක මුදලක් සහ රුපියල් 1,300,000.00ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. ඩබ්ලිව්. මලවිපතිරණ විසින්

සහතික කරන ලද 2018.12.27 සහ 2018.12.28 දිනැති උකස් සාධනපත්‍ර සහ ඊට අදාළ නියමයන් සහ කොන්දේසි අඩංගු ඇමුණුම් ලියා අත්සන් කොට තබා, එකී ණය පහසුකම් නිසා යුනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් හැටහයලක්ෂ පනස්දහසක (රු. 6,650,000.00) මුදල සහ ඒ මත පොළිය ගෙවීම පිණිස මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපළ පොදු ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, තව ද, එකී උකස්කර පිළිවෙලින් අංක 00042520909 සහ 00042520908 දරන හිමිකම් සහතික යටතේ ලියාපදිංචි කර ඇති බැවින් ද,

ඒ අනුව, එකී ණය පහසුකම නිසා 2020.08.23 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් හැත්තෑඑක්ලක්ෂ අසූදහස් තිස්හතරකුත් ශත හතළිස්පහක (රු. 7,180,034.45) මුදලක් සහ එකී ණය පහසුකම නිසා මුල් හිඟ මුදල වන රුපියල් හැටහතරලක්ෂ දෙදහස් එකසිය විසිතුනකුත් ශත හතරක (රු. 6,402,123.04) මුදල මත 2020.08.24 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20.50% බැගින් තවදුරටත් පොළියක් සහ එකී බන්ධනදායින් වෙතින් යුනියන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

ඉහත කී ණය ශේෂය හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායින් විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, එකී ණය පහසුකම නිසා 2020.08.23 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් හැත්තෑඑක්ලක්ෂ අසූදහස් තිස්හතරකුත් ශත හතළිස්පහක (රු. 7,180,034.45) මුදලක් සහ එකී ණය පහසුකම නිසා මුල් හිඟ මුදල වන රුපියල් හැටහතරලක්ෂ දෙදහස් එකසිය විසිතුනකුත් ශත හතරක (රු. 6,402,123.04) මුදල මත 2020.08.24 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20.50% බැගින් තවදුරටත් පොළියක් සහ තව ද, ඉහත කී උකස් සාධනපත්‍ර සහ ඊට අදාළ නියමයන් සහ කොන්දේසි අඩංගු ඇමුණුම් ප්‍රකාරව සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද, යම් ලැබී ඇති මුදලක් (වෙතොත්) එය අඩුකොට, අයකර ගැනීම සඳහා ඉහත කී උකස් සාධනපත්‍ර සහ ඊට අදාළ නියමයන් සහ කොන්දේසි අඩංගු ඇමුණුම් ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක දේපළ වෙන්දේසිකරුවන් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 548 දරන කල්දේමුල්ල සහ අංක 548C දරන ධම්පුර ග්‍රාම නිලධාරි වසමේ, කල්දේමුල්ලේ පිහිටි, මිනුම්පති විසින් සහතික කරන ලද අංක 520213 දරන කැඩැස්තර (කඩඉම්) සිතියමේ නිරූපිත කලාප අංක 02 හි කැබලි අංක 04 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : කලාප අංක 03 ද, නැගෙනහිරට : ලොට් 7 සහ 5 ද, දකුණට : ලොට් 3 සහ ලුනාව ඇළ ද, බස්නාහිරට : ලොට් 2 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 520213 දරන කැඩැස්තර (කඩඉම්) සිතියම අනුව හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි හතරයි පහක් (හෙක්. 0.0245) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ සඳහා දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් අංක 00042520909 දරන හිමිකම් සහතිකය නිකුත් කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 548 දරන කල්දේමුල්ල සහ අංක 548C දරන ධම්පුර ග්‍රාම නිලධාරි වසමේ කල්දේමුල්ලේ පිහිටි, මිනුම්පති විසින් සහතික කරන ලද අංක 520213 දරන කැඩැස්තර (කඩඉම්) සිතියමේ නිරූපිත කලාප අංක 02හි කැබලි අංක 05 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 7 ද, නැගෙනහිරට : ලොට් 8 ද, දකුණට : ලොට් 3 සහ 6 ද, බස්නාහිරට : ලොට් 4 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 520213 දරන කැඩැස්තර (කඩඉම්) සිතියම අනුව හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි බින්දුවයි අටයි එකක් (හෙක්. 0.0081) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ සඳහා දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් අංක 00042520908 දරන හිමිකම් සහතිකය නිකුත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-19

---

### යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු "යුනියන් බැංකුව) වශයෙන් හඳුන්වන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 ජනවාරි මස 27 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල

රැස්වීමේදී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, දෙනිපිටිය, පොල්වත්ත, ගනේවත්ත "නදීෂා" හි පදිංචි ජාසින් පතිරණගේ රංජිත් බන්දුල (ජාතික හැඳුනුම්පත් අංක 592845563V දරන) සහ එකී ජනරජයේ අම්බලන්තොට, බැම්මිණියන්විල, හංගන්වගුර, අංක 347 දරන ස්ථානයේ පදිංචි ගරුසිංහ ආරච්චිගේ නන්දා මාලනී (ජාතික හැඳුනුම්පත් අංක 667781531V දරන) (මෙහි මින්මතු "බන්ධනදායින්/ උකස්කරුවන්" වශයෙන් හඳුන්වන) යන අය විසින් මූල්‍ය පහසුකම් ගණනාවක් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායින්/උකස්කරුවන් විසින් පිළිවෙලින් රුපියල් 8,500,000.00ක මුදලක් සහ රුපියල් 2,300,000.00ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් අයි. පී. ආරියසේන විසින් සහතික කරන ලද අංක 9280 සහ 2016.02.12 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් විසින් සහතික කරන ලද අංක 10529 සහ 2018.02.06 දිනැති ද්විතීයික උකස් බැඳුම්කරය සහ පිළිවෙලින් රුපියල් 10,000,000.00ක මුදලක් සහ රුපියල් 2,950,000.00ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් පී. එල්. චන්ද්‍රසේන විසින් සහතික කරන ලද අංක 1359 සහ 2018.01.15 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් විසින් සහතික කරන ලද අංක 1556 සහ 2019.05.27 දිනැති ද්විතීයික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, එකී මූල්‍ය පහසුකම් නිසා මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී) (මෙහි මින්මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙත ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල් දෙකෝටි හැටහතරලක්ෂ අනූහතරදහස් දෙසිය දාහතකුත් ශත දාසයක (රු.26,494,217.16) මුදලක් සහ ඉහත කී මූල්‍ය පහසුකම්වල හිඟ මුල් මුදල මත තවදුරටත් පොළියක් එකී බන්ධනදායින්/උකස්කරුවන් වෙතින් යුනියන් බැංකුව වෙත මෙහි පහත සඳහන් පරිදි අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද, එනම්,

1. 2020.08.09 වැනි දිනට අංක 494001000002208 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් හැත්තෑතුන්ලක්ෂ දාහත්දහස් දෙසිය හැත්තෑ තුනකුත් ශත හැත්තෑහයක (රු. 7,317,273.76) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් හැටතුන් ලක්ෂ අනූහතරදහස් හයසිය අනූඑකකුත් ශත විසිතුනක (රු. 6,394,691.23) මුල් හිඟ මුදල මත 2020.08.10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20.50% බැගින් පොළිය;

2. 2020.08.09 වැනි දිනට අංක 494001000002217 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි හැත්තෑඅටලක්ෂ අනූහතරදහස් පන්සිය විසිහතකුත් ශත අසූතුනක (රු. 17,894,527.83) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි පනස්හයලක්ෂ හැටදහසක (රු. 15,660,000.00) මුල් හිඟ මුදල මත 2020.08.10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20.50% බැගින් පොළිය ;

3. 2020.08.09 වැනි දිනට අංක 494001000002226 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් දොළොස්ලක්ෂ අසූදෙදහස් හාරසිය පහළොවකුත් ශත පනස්හතක (රු. 1,282,415.57) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් එකළොස්ලක්ෂ විසිදහසක (රු. 11,20,000.00) මුල් හිඟ මුදල මත 2020.08.10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20.50% බැගින් පොළිය:

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායින්/උකස්කරුවන් විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, එකී ණය පහසුකම් නිසා 2020.08.09 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් දෙකෝටි හැටහතරලක්ෂ අනූහතරදහස් දෙසිය දාහතකුත් ශත දාසයක (රු. 26,494,217.16) මුදල සහ ඉහත සඳහන් පරිදි පොළිය සහ තව ද, එකී අංක 9280 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, අංක 10529 දරන ද්විතීයික උකස් බැඳුම්කරය, අංක 1359 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 1556 දරන ද්විතීයික උකස් බැඳුම්කරය යටතේ සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා, එකී අංක 9280 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, අංක 10529 දරන ද්විතීයික උකස් බැඳුම්කරය, අංක 1359 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 1556 දරන ද්විතීයික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමුවන උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම කෝරළයේ, වැලිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර පැලෑන ග්‍රාම නිලධාරි වසමේ පැලෑනේ පිහිටි මාතර පාරේ, වරිපනම් අංක 502 දරන සේනාරත්න ජාන්කලපුව වත්ත වශයෙන් හඳුන්වන ජාන්කලපුවවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. විජේවීර විසින් මැන සාදන ලද අංක 6361 සහ 2011.04.30 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 4 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට

මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් 3 සහ 12 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 10 (ප්‍රවේශ මාර්ගය) ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 11 සහ 15 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 5 සහ වඩක්කරවත්ත ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිතුනකුත් දශම අටක් (පර්. 23.8) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, ගහකොළ, වැවිලි, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වන අතර, මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P 72/137 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කරන ලදුව, වර්තමානය වන විට P 156/68 දරන වෙළුම/පත්ඉරුව වෙත ගෙන ගොස් ඇත.

ඉහත කී ලොට් 4 මෑතකාලීනව මැන බෙදා වෙන්කොට සවිස්තරව දක්වා ඇති අතර, එය පහත දැක්වේ :-

ඉහත කී පැලැන ගමේ පිහිටි මාතර පාරේ, වරිපනම් අංක 502 දරන සේනාරත්න ජාන්කලපුව වත්ත වශයෙන් හඳුන්වන ජාන් කලපුවවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් මැන සාදන ලද අංක 3692 සහ 2015.01.08 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 4 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට (බලයලත් මිනින්දෝරු එන්. විජේවීර විසින් මැන සාදන ලද අංක 6361 සහ 2011.04.30 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 4හි නැවත මැන බෙදීමක් වන) මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් 3, 12 සහ 10 (පොදු ප්‍රවේශ මාර්ගය) ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 10 (ප්‍රවේශ මාර්ගය) ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 5 සහ 11 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 3 සහ 5 සහ වඩක්කරවත්ත ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3692 දරන පිඹුර අනුව පර්චස් විසිතුනකුත් දශම අටක් (පර්. 23.8) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, ගහකොළ, වැවිලි, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේත් සමග ය.

තව ද, බලයලත් මිනින්දෝ එන්. විජේවීර විසින් මැන සාදන ලද අංක 6361 සහ 2011.04.30 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 10 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

**දෙවන උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලව ග්‍රාම නිලධාරී වසමේවලව ගමේ පිහිටි "යෝධවැව මුණුපැලිය කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් මැන සාදා සහතික කරන ලද අංක H/5504 සහ 2007.01.24 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : එම්. ඒ. සුමනාවතී යන අය විසින් හිමිකම් කියන රජයේ ඉඩම සහ ප්‍රධාන පාර ද, නැගෙනහිරට : ලොට් Bද, දකුණට : වැව් කන්ඩිය පාර සහ කුඹුර ද, බස්නාහිරට : කුඹුර ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකකුත් පර්චස් තිස්පහයි දශම එකක් (රූ.1, පර්. 35.1) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සහ තව ද, ප්‍රවේශ මාර්ගය භාවිත කිරීමේ පොදු අයිතිය ද සමඟ ය. මෙම දේපළ හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 29/60 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කරන ලදුව වර්තමානය වන විට H 36/21 දරන වෙළුම/පත්ඉරුව වෙත ගෙන ගොස් ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-21

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුවන්ගේ නම් : මොහොමඩ් තාහීර් මොහොමඩ් අක්රම් සහ මොහොමඩ් තාහීර් මොහොමඩ් නයිෆර් (මතුරට ඇග්‍රෝ ඉම්පෙක්ස් හි හවුල් අයිතිකරුවෝ)
ශාඛාව - වේල්ල වීදිය

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2021 ක්වූ මාර්තු මස 25 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, මතුරට ඇග්‍රෝ ඉම්පෙක්ස් හි හවුල් අයිතිකරුවන් වන මොහොමඩ් තාහීර් මොහොමඩ් අක්රම් සහ මොහොමඩ් තාහීර් මොහොමඩ් නයිෆර් යන අය බන්ධනදායීන් වශයෙන් ද, මොහොමඩ් තාහීර් මොහොමඩ් අක්රම් යන අය උකස්කරු වශයෙන් ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. ඒ. දයානන්ද විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.06.28 දිනැති අංක 617 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 617 දරන උකස්කරය මත,

(අ) වර්ෂ 2021.03.04 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පනස් හය ලක්ෂ හැත්තෑපන් දහස් නවසිය විසි නවයයි ශත තිස් තුන (රු. 5,675,929.33)ක මුදලක් ද, වර්ෂ 2021.03.05 වැනි දින සිට රුපියල් හතලිස් නව ලක්ෂ අනූනව දහස් හාරසිය අනූ හයයි ශත පනහ (රු. 4,999,496.50)ක මුදල මත වර්ෂයකට 19% ක පොළිය ද,

(ආ) වර්ෂ 2021.03.04 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකොළොස් මිලියන නවලක්ෂ විසි එක් දහස් එකසිය හැට නවයයි ශත හතලිස් හය (රු. 11,921,169.46)ක මුදලක් ද, වර්ෂ 2021.03.05 වැනි දින සිට රුපියල් දස මිලියන අට ලක්ෂ අනූ හතර දහස් නවසිය හැට එකයි ශත විසි එක (රු. 10,894,961.21)ක මුදල මත වර්ෂයකට 18%ක පොළිය ද,

(ඇ) වර්ෂ 2021.02.28 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකොළොස් මිලියන එක් ලක්ෂ අනූපන් දහස් අටසිය හැත්තෑ අටයි ශත හැත්තෑ එක (රු. 11,195,878.71)ක මුදලක් ද, වර්ෂ 2021.03.01 වැනි දින සිට රුපියල් දස මිලියන (රු. 10,000,000.00)ක සීමාව දක්වා වූ මුදල මත වර්ෂයකට 18%ක පොළිය ද, රුපියල් දස මිලියන (රු. 10,000,000.00) ඉක්මවන මුදල මත වර්ෂයකට 29%ක පොළිය ද,

ඉහත කී බන්ධනදායීන්/උකස්කරුගෙන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු මුලු මුදල වන රුපියල් විසි අට මිලියන හත් ලක්ෂ අනූ දෙදහස් නවසිය හැත්තෑ හතයි ශත පනහ (රු. 28,792,977.50)ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වාන නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වල්ගම ගමෙහි පිහිටි, මල්වාන පාර, වරිපනම් අංක 780/1 දරන අලමුල්ල ඕවිට *හෙවත්* හල්ගස් ඕවිට *හෙවත්* කම්මල් ඕවිට හෝ වත්ත බෙල්ගහවත්ත *හෙවත්* ගලහ ඕවිට *හෙවත්* දියතොටුපලවත්ත හෙවත් ගැනුනාන තොටුපලවත්ත නමින් හඳුන්වන ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සම්පාදිත 2014.03.05 දිනැති අංක 7528 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A1/1 නැමැති (බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සම්පාදිත 2013.07.27 දිනැති අංක 7324 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A1 හි නැවත මැනීමක් වන) උතුරින් : එම්. එල්. එම්. ෂෙරිෆ් විසින් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරින් : පහුරු ඔය ද, දකුණින් : පහුරු ඔය සහ මෙම දේපළෙහි ලොට් 1A3/1 සහ 1A5/1 ද, බස්නාහිරින් : මෙම දේපළෙහි ලොට් 1A5/1 සහ පාර ද මායිම් වූ එකී පිඹුරු අංක 7528 පරිදි ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම එකයි බිංදුව (පර්. 36.10)ක් *හෙවත්* හෙක්ටෙයාර 0.09131 විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩැගිලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු N508/77හි ලියාපදිංචිව ඇත.

මෙම ලොට් 1A1/1 දරන ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වේ :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වාන නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වල්ගම ගමෙහි පිහිටි අලමුල්ල ඕවිට *හෙවත්* හල්ගස් ඕවිට *හෙවත්* කම්මල් ඕවිට හෝ වත්ත බෙල්ගහවත්ත *හෙවත්* ගලහ ඕවිට *හෙවත්* දියතොටුපලවත්ත *හෙවත්* ගැනුනාන තොටුපලවත්ත නමින් හඳුන්වන ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සම්පාදිත 2013.07.27 දිනැති අංක 7324 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A1 නැමැති උතුරින් : එම්. එල්. එම්. ෂෙරිෆ් විසින් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරින් : පහුරු ඔය ද, දකුණින් : පහුරු ඔය සහ මෙම දේපළෙහි ලොට් 1A5 ද, බස්නාහිරින් : මෙම දේපළෙහි ලොට් 1A5 ද පාර ද මායිම් වූ එකී පිඹුරු අංක 7324 පරිදි ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම එකයි බින්දුව (පර්. 36.10)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු N 88/26 හි ලියාපදිංචිව ඇත.

(2) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වාන නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වල්ගම ගමෙහි පිහිටි මල්වාන පාර, වරිපනම් අංක 780/4 දරන අලමුල්ල ඕවිට *හෙවත්* හල්ගස් ඕවිට *හෙවත්* කම්මල් ඕවිට හෝ වත්ත බෙල්ගහවත්ත *හෙවත්* ගලහ ඕවිට *හෙවත්* දියතොටුපලවත්ත *හෙවත්* ගැනුනාන තොටුපලවත්ත නමින් හඳුන්වන ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සම්පාදිත 2014.03.05 දිනැති අංක 7528 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A2/1 නැමැති (බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සම්පාදිත 2013.07.27 දිනැති අංක 7324 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A1 හි නැවත මැනීමක් වන) උතුරින් : පාර ද, නැගෙනහිරින් : පාර සහ ලොට් 1A5/1 ද, දකුණින් : ලොට් 1A3/1 ද, බස්නාහිරින් : පාර ද මායිම් වූ එකී පිඹුරු අංක 7528 පරිදි ප්‍රමාණයෙන්

රූඩ් එකයි පර්චස් නවයයි දශම පහ (රූ.01, පර්.9.5)ක් *හෙවත්* හෙක්ටෙයාර 0.12521 විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු N 508/78හි ලියාපදිංචිව ඇත.

මෙම ලොට් 1A2/1 දරන ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වාන නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වල්ගම ගමෙහි පිහිටි, අලමුල්ල ඕවිට *හෙවත්* හල්ගස් ඕවිට *හෙවත්* කම්මල් ඕවිට හෝ වත්ත බෙල්ගහවත්ත *හෙවත්* ගලහ ඕවිට *හෙවත්* දියතොටුපලවත්ත *හෙවත්* ගැනුනාන තොටුපලවත්ත නමින් හඳුන්වන ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සම්පාදිත 2013.07.27 දිනැති අංක 7324 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A2 නමැති උතුරින් : පාර ද, නැගෙනහිරින් : පාර සහ ලොට් 1A5 ද, දකුණින් : ලොට් 1A3 ද, බස්නාහිරින් : පාර ද මායිම් වූ එකී පිඹුරු අංක 7324 පරිදි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නවයයි දශම පහයි බින්දුව (රූ.01, පර්. 9.50) විශාලත්වය ඇති ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු N 88/27 හි ලියාපදිංචිව ඇත.

තව ද පහත දැක්වෙන ඉඩම් මතින් සහ ඔස්සේ වන මාර්ග පරවශ්‍යතාව ද සමග වේ.

1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (ගම්පහ ලියාදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවෙහි බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වාන නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වල්ගම ගමෙහි පිහිටි, අලමුල්ල ඕවිට *හෙවත්* හල්ගස් ඕවිට *හෙවත්* කම්මල් ඕවිට හෝ වත්ත බෙල්ගහවත්ත *හෙවත්* ගලහ ඕවිට *හෙවත්* දැයතොටුපලවත්ත *හෙවත්* ගැනුනාන තොටුපලවත්ත නමින් හඳුන්වන ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සම්පාදිත 2013.07.27 දිනැති අංක 7324 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A5 (අඩි 15 පළල මාර්ග රක්ෂිතය) නැමැති, උතුරින් : පාර ද, නැගෙනහිරින් : පහුරු ඔය සහ ලොට් 1A1 ද, දකුණින් : පහුරු ඔය සහ ලොට් 1A4 ද, බස්නාහිරින් : ලොට් 1A3 සහ ලොට් 1A2 ද මායිම් වූ එකි පිඹුරු අංක 7324 පරිදි ප්‍රමාණයෙන් පර්චස් විසි තුන (පර්. 23)ක් විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු N 88/28හි ලියාපදිංචිව ඇත.

2) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (ගම්පහ ලියාදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවෙහි බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වාන නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වල්ගම ගමෙහි පිහිටි, ඔතුදෙනකැබැල්ලගහ ඕවිට නමින් හඳුන්වන ඉඩම බලයලත් මිනින්දෝරු කේ. ජී. හර්බට් පෙරේරා විසින් සම්පාදිත 1987.01.15 දිනැති අංක 3682 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 (මාර්ගය සඳහා රක්ෂිතය) නමැති උතුරින් : කොළඹ සිට දෙකටන දක්වා වූ ප්‍රධාන පාර ද, නැගෙනහිරින් : ලොට් 2 ද, දකුණින් : එම්. එල්. ඒ. රිෆ්සි විසින් හිමිකම් කියන ජම්බුගස් ඕවිට ද, බස්නාහිරින් : ලොට් 1 ද, මායිම් වූ එකී පිඹුරු අංක 3682 පරිදි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම හතර (පර්. 3.4)ක් විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු N 88/25හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණිය - ණය අයකර ගැනීම්.

05-08

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි.

ණුදෙනුකරුගේ නම : මල්ෂා රවිහාරි සුදූසිංහ
ශාඛාව - අම්බලන්තොට

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2020 ක්වූ දෙසැම්බර් මස 17 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, මල්ෂා රවිහාරි සුදූසිංහ යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද වර්ෂ 2017.04.25 දිනැති අංක 16063 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 16063 දරන උකස්කරය මත,

වර්ෂ 2020.12.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පනස් ලක්ෂ හතලිස් අටදහස් හාරසිය පනස් අටයි ශත පනහ (රු. 5,048,458.50)ක මුදලක් ද, වර්ෂ 2020.12.04 වැනි දින සිට රුපියල් හතලිස් හත් ලක්ෂ විසිහත් දහස් එකසිය තිස් හතරයි ශත අනූපහ (රු. 4,727,134.95)ක මුදල මත වර්ෂයකට 18%ක පොළිය ද ඉහත කී බන්ධනදායී/උකස්කරුගෙන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු මුළු මුදල වන රුපියල් පනස් ලක්ෂ හතලිස් අටදහස් හාරසිය පනස් අටයි ශත පනහ (රු. 5,048,458.50)ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවා පත්තුවෙහි නැගෙනහිර, හම්බන්තොට ප්‍රාදේශීය සභා සීමාවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැදගම පිහිටි, ඩිංගිරි ඇල බැද්ද *හෙවත්* ඕඩෙ කුඹුර මලිත්තන්ගහ කුඹුර සහ මලිත්තන්ගහ වත්ත නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සොන්නාදර විසින් සම්පාදිත 2006.09.27 දිනැති අංක 1003 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 නැමැති උතුරින් : ඩිංගිරි ඇල බැද්ද කුඹුර සහ මෙම ඉඩමෙහි කොටසක් ද, නැගෙනහිරින් : මෙම ඉඩමෙහි කොටසක් ද, දකුණින් : අම්බලන්තොට - හම්බන්තොට ප්‍රධාන පාර ද, බස්නාහිරින් අංක 1003 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම තුනයි දෙකක (පර්. 12.32)ක් *හෙවත්* හෙක්ටෙයාර 0.031150 විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව H 25/58හි ලියාපදිංචිව ඇත.

මෙම ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වේ.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවා පත්තුවෙහි නැගෙනහිර, හම්බන්තොට ප්‍රාදේශීය සභා සීමාවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැදගම පිහිටි, ඩිංගිරි ඇල බැද්ද *හෙවත්* ඕඩෙ කුඹුර මලිත්තන්ගහ කුඹුර සහ මලිත්තන්ගහ වත්ත නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සම්පාදිත 2016.04.04 දිනැති අංක 7634 දරන පිඹුරේ දැක්වෙන ලොට් A නැමැති, උතුරින් : ඩිංගිරි ඇල බැද්ද කුඹුර නැමැති ඉඩමෙහි ඉතිරි කොටස ද, නැගෙනහිරින් : ඩිංගිරි ඇල බැද්ද කුඹුර නැමැති ඉඩමෙහි ඉතිරි කොටස ද, දකුණින් : අම්බලන්තොට - හම්බන්තොට : ප්‍රධාන පාර ද, බස්නාහිරින් : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සොන්නාදර විසින් සම්පාදිත අංක 1003 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම තුනයි දෙක (පර්. 12.32) *හෙවත්* හෙක්ටෙයාර 0.031150 විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අරුණ ගුරුගේ,
සහකාර කළමණාකරු - ණය අයකර ගැනීම්.

05-09

---

### මහජන බැංකුව - මහනුවර ශාඛාව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29 D) වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29 D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.10.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. රත්නායක මහත්මිය විසින් 2016.08.01 වැනි දින ලියා සහතික කරන ලද 5115 දරන

උකස්කරය, 2017.12.05 වැනි දිනැති ලියා සහතික කරන ලද 5613 දරන උකස්කරය සහ ඩී. ජී. එස්. ඊ. දයාරත්න මහත්මිය විසින් 2018.11.21 දින ලියා සහතික කරන ලද අංක 6061 දරන උකස්කරයට අනුව අංක 521, පේරාදෙණිය පාර, මහනුවර යන ස්ථානයෙහි ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV 104104 මගින් නිසි පරිදි සංස්ථාපනය කරන ලද ටෂින් ඇන්ඩ් ඔලිව් (ප්‍රයිවට් ලිමිටඩ්) පුද්ගලික සමාගම, වීරසේකර මුදියන්සේලාගේ ඉන්දික තුෂාර සහ විජේකෝන් මුදියන්සේලාගේ අනෝමා සෝභානි යන අයවලුන් විසින් එකී උකස්කරයන් මත ලබාගන්නා ලද සියළු පහසුකම් පැහැර හැර ඇති බැවින් ද, 5115 දරන උකස්කරය මත (රු. 11,787,535.33)ක් එක්කෝටි දාහත් ලක්ෂ අසූ හත් දහස් පන්සිය තිස්පහයි ශත තිස් තුනක හා (රු. 10,120,799.69)ක එක්කෝටි එක්ලක්ෂ විසිදහස් හත්සිය අනූ නවයයි ශත හැට නවයක මුදලකට 2021.10.05 වැනි දින සිට 17% පොළිය ද සහ (රු. 2,387,006.19)ක් විසිතුන් ලක්ෂ අසූ හත් දහස් හයයි ශත දහනවයක හා (රු. 2,043,811.98) විසි ලක්ෂ හතලිස් තුන්දහස් අටසිය එකොළහයි ශත අනූ අටක මුදලකට 2021.10.05 වැනි දින සිට 17%ක පොළිය ද, 5613 දරන උකස්කරය මත (රු. 1,703,758.61) රුපියල් දාහත් ලක්ෂ තුන් දහස් හත්සිය පනස් අටයි ශත හැට එකක මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල හා (රු. 1,360,000.00) රුපියල් දහතුන් ලක්ෂ හැට දහසක මුදලකට 2021.10.05 වැනි දින සිට වර්ෂයකට 17% බැගින් පොළිය ද, එකී 6061 දරන උකස්කරය සඳහා (රු. 10,972,420.20) රුපියල් එක්කෝටි නව ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසිය විස්සයි ශත විස්සක හා (රු. 9,990,000.00)ක රුපියල් අනූ නව ලක්ෂ අනූ දහසක මුදලකට 2021.10.05 වැනි දින සිට AWPLR + 3.5% සහ 2% බැගින් දඩ පොළිය ද, සමග වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, බැංකුවට අයවීමට ඇති බැවින්, මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග වෙනත් කිසියම් ගෙවීමක් ඇත්නම් ඒවා අඩුකර එකී මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. රත්නායක මහත්මිය විසින් 2016.08.01 වැනි දින ලියා සහතික කරන ලද 5115 දරන උකස්කරය, 2017.12.05 වැනි දිනැති ලියා සහතික කරන ලද 5613 දරන උකස්කරය සහ ඩී. ජී. එස්. ජී. දයාරත්න මහත්මිය විසින් 2018.11.21 දින ලියා සහතික කරන ලද අංක 6061 දරන උකස්කරය ප්‍රකාරව බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණිය යුතු යැයි 1986 මහජන බැංකු පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාවේ, මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අනිවත්ත - බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ජෝර්ජ් ඊ. ද සිල්වා මාවතෙහි පිහිටි ප්‍රිම්රෝස්හිල් වත්ත නමැති ඉඩමට බලයලත් මානක ජී. එස්. ජී. ලෙනගල මහතා විසින් 1995.09.21 දින මැන සාදන ලද අංක 684 දරන පිඹුරේ ලොට් අංක 25 දරන පර්චස් 11.5ක (පර්. 11.5ක) (හෙක්ටයාර් 0.0291) විශාල,

උතුරට : කැබලි අංක 32 දරන පාර හා පාරේ වටරවුම, කාණුව ද, නැගෙනහිරට කැබලි අංක 26 ද, දකුණට : ලොට් අංක 32 දරන පාර ද, බස්නාහිරට : ලොට් අංක 24ද, යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ගහකොළ, පළතුරු, ගොඩනැගිලි සහ ඊට අයත් සෑම සියලුදේද සමඟ වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ/585/141 පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
17, දළදා වීදිය, මහනුවර.

05-53

---

### පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී - ගම්පහ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ණයුදෙනුකරුගේ නම : වක් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2021ක් වූ අප්‍රේල් මස 29 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම් වක් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම බන්ධනදායි /උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2018.05.18 දිනැති අංක 346 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2018.12.31 දිනැති අංක 476 දරන ද්විතීයක උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 346 සහ 476 දරන උකස්කරයන් මත,

(අ) වර්ෂ 2021.02.28 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දස මිලියන හය ලක්ෂ අනූ දහස් හයසිය විසි අටයි ශත පනස් දෙකක (රු. 10,690,628.52) මුදලක් ද, වර්ෂ 2021.03.01 වැනි දින සිට රුපියල් මිලියන හතක (රු. 7,000,000) සීමාව දක්වා වූ වර්ෂයකට 17%ක පොළිය ද, රුපියල් මිලියන හතක (රු. 7,000,000) ඉක්මවන මුදල මත වර්ෂයකට 29%ක පොළිය ද,

(ආ) වර්ෂ 2021.03.11 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හතළිස් හය ලක්ෂ හතළිස් දහස් පණස් පහයි ශත පණස් නවයක (රු. 4,640,055.59) මුදලක් ද, වර්ෂ 2021.03.12 වැනි දින සිට රුපියල් හතළිස් තුන් ලක්ෂ පණස් හත් දහස් හාරසිය අටයි ශත පණස් පහක (රු.4,357,408.55) මුදල මත වර්ෂයකට 19%ක පොළිය ද,

(ඇ) රුපියල් මිලියන දෙකක (රු. 2,000,000) වටිනාකම ඇති අංක BGPAB 0111900538 දරන බැංකු ඇපකර පහසුකම යටතේවූ නිශ්චිත නොවූ බන්ධන වගකීම ද,

ඉහත කී බන්ධනදායී/ උකස්කරුගෙන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු රුපියල් මිලියන දෙකක (රු. 2,000,000) වටිනාකම ඇති බැංකු ඇපකර පහසුකම යටතේ වූ වගකීමෙහි ප්‍රමාණයට යටත්ව මුලු මුදල වන රුපියල් පහළොස් මිලියන තුන් ලක්ෂ තිස් දහස් හයසිය අසූ හතරයි ශත එකොළහක (රු. 15,330,684.11) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසි දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව, කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, අත්තනගල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවෙහි අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොස්කඳවල අංක 308 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොස්කඳවල ග්‍රාමයෙහි පිහිටි, මාරග හවත්ත හෝ මාරගහවත්තේ කොටසක් *හෙවත්* මාරගහවත්ත කැබැල්ල නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු කේ. ඒ. අනුරුද්ධ පෙරේරා විසින් සම්පාදිත 2014.03.23 දිනැති අංක 839 දරන පිඹුරේ දක්වෙන ලොට් 6A1 නමැති (බලයලත් මිනින්දෝරු ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් සම්පාදිත 1998.11.24 දිනැති අංක 1330 දරන පිඹුරේ දක්වෙන ලොට් 6A හි පවත්නා මායිම්වල නැවත මැනීමක් වන) උතුරින් : බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජේ. රණසිංහ විසින් සම්පාදිත 1998.10.11 දිනැති අංක 1583 දරන පිඹුරේ දක්වෙන ලොට් 1 සහ 5 ද, නැගෙනහිරින් : බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජේ. රණසිංහ විසින් සම්පාදිත 1998.10.11 දිනැති අංක 1583 දරන පිඹුරේ දක්වෙන ලොට් 5 සහ ප්‍රාදේශීය සභා පාර ද, දකුණින් : බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජේ. රණසිංහ විසින් සම්පාදිත 1998.10.11 දිනැති අංක 1583 දරන පිඹුරේ දක්වෙන ලොට් 6B ද, බස්නාහිරින් : කේ. කේ. ජයන්ත ගුණසේකර හිමිකම් කියන ඉඩම සහ කේ. කේ. අනුර ගුණසේකර සහ බී. පුෂ්පකාන්ති විජේසිංහ හිමිකම් කියන ඉඩම ද මායිම් වූ එකී අංක 839 දරන පිඹුර පරිදි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිහයි දශම හතයි හතරක් (රූ. 02, පර්. 30.74) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ.

මෙය ලොට් 6A1 නමැති ඉඩම පහත දක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, අත්තනගල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවෙහි අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොස්කඳවල අංක 308 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොස්කඳවල පිහිටි, මාරගහවත්ත කැබැල්ල නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් සම්පාදිත 1998.11.24 දිනැති අංක 1330 දරන පිඹුරේ දක්වෙන ලොට් 6A නමැති උතුරින් : අංක 1583 දරන පිඹුරේ දක්වෙන ලොට් 1 - 6 එහෙත් වඩාත් නිවැරදිව බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජේ. රණසිංහ විසින් සම්පාදිත 1998.10.11 දිනැති අංක 1583 දරන පිඹුරේ දක්වෙන ලොට් 1 සහ 5 ද, නැගෙනහිරින් : බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජේ. රණසිංහ විසින් සම්පාදිත 1998.10.11 දිනැති අංක 1583 දරන පිඹුරේ දක්වෙන ලොට් 5 සහ ප්‍රාදේශීය සභා පාර ද, දකුණින් : අංක 1583 දරන පිඹුරේ දක්වෙන ලොට් 6B ද, බස්නාහිරින් : ඩී. සී. අප්පුහාමි විසින් හිමිකම් දූන් ජයසේකර හිමිකම් කියන ඉඩම ද මායිම් වූ එකී අංක 1330 දරන පිඹුර පරිදි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් එකයි දශම හයයි නවයක (අ. 0, රූ. 02, පර්. 31.69) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්ඉරු B 15/116 හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණී - ණය අයකර ගැනීම්.

05 - 10

**යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 ජනවාරි මස 31 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අකුරැස්ස, දෙණියාය පාර, අංක 111 දරන ස්ථානයේ පදිංචි, "වට්ටක්ගොඩ ප්‍රොඩියුසර්ස්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන, වීරසිංහ මීගහවත්තගේ දම්නාත් පාරින්ද (ජාතික හැඳුනුම්පත් අංක 811352888V දරන), මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායී/උකස්කරු" වශයෙන් හඳුන්වන,) යන අය විසින් මූල්‍ය පහසුකම් ගණනාවක් (මෙහි මින්මතු "එකී ණය පහසුකම්" වශයෙන් හඳුන්වන,) ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී/උකස්කරු ඇමෙරිකානු ඩොලර් පන්ලක්ෂයක (ඇ.ඩො. 500,000.00) මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන පනන්ගල විසින් සහතික කරන ලද අංක 10459 සහ 2017.12.21 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කර ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන,) වෙත අයවිය යුතු එකී මූල්‍ය පහසුකම් සහ ඒ මත පොලිය ගෙවීම පිණිස මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා, 2021.07.18 වැනි දිනට ඇමෙරිකානු ඩොලර් හයලක්ෂ නවදහස් දෙසිය විසිහතකුත් ශත හතළිස් හතරක (ඇ. ඩො. 609,227.44) මුදලක් සහ තවදුරටත් පොලියක් එකී බන්ධනදායී/ උකස්කරු වෙතින් යුනියන් බැංකුව වෙත මෙහි පහත සඳහන් පරිදි අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද, එනම් :

(i) 2021.07.18 වැනි දිනට අංක 6340000000013 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ඇමෙරිකානු ඩොලර් පන්ලක්ෂ විසිපන්දහස් හාරසිය තිස්දෙකකුත් ශත හතළිස් හතරක (ඇ. ඩො. 525,432.44) මුදල සහ තව ද, ඇමෙරිකානු ඩොලර් හාරලක්ෂ අනූනවදහස් හයසිය අනූදෙකක (ඇ.ඩො. 499,692/-) මුල් මුදල මත 2021.07.19 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 8% බැගින් තවදුරටත් පොලිය ;

(ii) 2021.07.18 වැනි දිනට අංක 634002000000022 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ඇමෙරිකානු ඩොලර් හතළිස්හත්දහස් අටසිය පනස් පහක (ඇ.ඩො. 47,855/-) මුදල;

(iii) 2021.07.18 වැනි දිනට අංක 63020000000037 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ඇමෙරිකානු ඩොලර් දහනවදහස් නවසිය අසූඅටක (ඇ.ඩො. 19,988/-) මුදල;

(iv) 2021.07.18 වැනි දිනට අංක 634000000040 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ඇමෙරිකානු ඩොලර් පහළොස්දහස් නවසියපනස්දෙකක (ඇ. ඩො. 15,952/-) මුදල;

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායී/උකස්කරු විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියාකරමින්, ඉහත කී මූල්‍ය පහසුකම් මත 2021.07.18 වැනි දිනට මුළු හිඟ ණය මුදල වන ඇමෙරිකානු ඩොලර් හයලක්ෂ නවදහස් දෙසිය විසිහතකුත් ශත හතළිස් හතරක (ඇ.ඩො. 609,227.44) මුදලක් සහ ඉහත සඳහන් පරිදි පොළියක් සහ තව ද, අංක 10459 දරන එකී ප්‍රාථමික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ 1990 අංක  දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද, යම් ලැබී ඇති මුදලක් (වෙතොත්) එය අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 10459 දරන දැනට පවත්නා ප්‍රාථමික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන  එකී දේපළ, 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක දේපළ වෙන්දේසිකරුවන් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

තව ද, යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම විෂය කාරණය සම්බන්ධයෙන් 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ඒකමතිකව සම්මත කරන ලද 2019 දෙසැම්බර් මස 18 වැනි දින දරන යෝජනා සම්මතය, මෙම යෝජනා සම්මතය පිළිගැනීමෙන් අවලංගු/ප්‍රත්‍යාදිෂ්ට විය යුතු වන බවටත්, ඒ අනුව, මෙම යෝජනා සම්මතය මෙහි සඳහන් අරමුණු සඳහා බලාත්මක විය යුතු වන බවටත්, යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තවදුරටත් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

(1) දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළයේ, කොටපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙවරලිය ග්‍රාම නිලධාරි වසමේ, කිරිවැල්දොල ගමේ පිහිටි ගොස්හේන එනම් වඩාත් නිවැරදිව කිවහොත් ගොස්හේන් වත්ත (බෙවර්ලි වතුයායේ කොටසක්) නමැති ඉඩමට මැන සාදන ලද අංක 125 දරන අවසන් ගම් පිඹුරේ නිරූපිත ලොට් 49 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 28615 සහ 2015.11.27 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : MR 772/11 සහ දොළ ද, නැගෙනහිරට ඉහත කී අංක 28615 දරන පිඹුරේ නිරූපිත ලොට් B සහ C ද, දකුණට : අංක 28615 දරන පිඹුරේ නිරූපිත ලොට් C ද, බස්නාහිට : එම ඉඩමේ ලොට් 1 ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර පහකුත් රූඩ් තුනයි පර්චස් දහසයකුත් දශම හතරක් (අ.5, රූ.3, පර්.16.4) *නොහොත්* හෙක්ටයාර් 2.3684 විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 38/49 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) ඉහත කී කිරිවැල්දොල ගමේ පිහිටි ගොස්හේන එනම් වඩාත් නිවැරදිව කිවහොත් ගොස්හේන් වත්ත (බෙවර්ලි වතුයායේ කොටසක්) නමැති ඉඩමට මැන සාදන ලද අංක 125 දරන අවසන් ගම් පිඹුරේ නිරූපිත ලොට් 49 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 28615 සහ 2015.11.27 දින දරන පිඹුරේ නිරූපිත ලොට් B වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට පාර සහ දොළ ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ඉහත කී අංක 28615 දරන පිඹුරේ නිරූපිත MR 931/9 සහ ලොට් C ද, බස්නාහිරට : ඉහත කී අංක 28615 දරන පිඹුරේ නිරූපිත ලොට් C සහ A ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර හතරකුත් පර්චස් අටයි දශම හතරක් (අ.4, පර්. 8.4) *නොහොත්* හෙක්ටයාර් 1.5402 විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 38/50 යටතේ ලියාපදිංචි කර ඇත.

(3) ඉහත කී කිරිවැල්දොල ගමේ පිහිටි ගොස්හේන එනම් වඩාත් නිවැරදිව කිවහොත් ගොස්හේන් වත්ත (බෙවර්ලි වතුයායේ කොටසක්) නමැති ඉඩමට මැන සාදන ලද අංක 125 දරන අවසන් ගම් පිඹුරේ නිරූපිත ලොට් 49 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 28615 සහ 2015.11.27 දින දරන පිඹුරේ නිරූපිත ලොට් C වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම ඊසානට : ඉහත කී අංක 28615 දරන පිඹුරේ නිරූපිත ලොට් B ද, ගිණිකොනට MR 931/9 ද, නිරිතට : මෙම ඉඩමේම ලොට් 1 ද, වයඹට : ඉහත කී අංක 28615 දරන පිඹුරේ නිරූපිත ලොට් A ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකොළහකුත් රූඩ් තුනයි පර්චස් පහළොවයි දශම දෙකක් (අ.11, රූ.03, පර්.15.2) *නොහොත්* හෙක්ටයාර් 4.7956 විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, ගහකොළ, වැවිලි, පලතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 38/51 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් A, B සහ C වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කැබලි වනාහි පහත සඳහන් ඉඩමේ නැවත මැන බෙදා වෙන් කිරීමක් වේ.

ඉහත කී කිරිවැල්දොල ගමේ පිහිටි ගොස්හේන එනම් වඩාත් නිවැරදිව කිවහොත් ගොස්හේන් වත්ත (බෙවර්ලි වතුයායේ කොටසක්) නමැති ඉඩමට මැන සාදන ලද අංක 125 දරන අවසන් ගම් පිඹුරේ නිරූපිත ලොට් 49 දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : පාර (අඩි 12ක් පළල) ද, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : රජයේ ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර විසිඑකකුත් රූඩ් තුනක් (අ.21, රූ.3) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 22/74 යටතේ ලියාපදිංචි කර ඇත.

(4) දකුණ පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභා සීමාවේ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩකන්ද ග්‍රාම නිලධාරි වසමේ ගොඩකන්ද කරාපිටිය ගමේ පිහිටි කරාපිටිය කුඹුරේ හෙවත් කරාපිටිය වත්ත අද්දර ඕවිටේ ලොට් 1, 2A1, 2A2, B2, B1B සහ B1A නමැති ඒකාබද්ධ කළ ඉඩම් කැබලිවලට බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. පතිරණ විසින් මැන සාදන ලද අංක 4424 සහ 2010.10.04 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ඉහත කී අංක 4424 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 4 ද, නැගෙනහිරට : ඉහත කී අංක 4424 දරන පිඹුරේ නිරූපිත ලොට් 5 (කොන්ක්‍රීට් කාණුව) සහ ලොට් 4 (පාර) ද, දකුණට : හිරිඹුර සිට කරාපිටිය දක්වා වැටී ඇති ප්‍රධාන පාර ද, බස්නාහිරට : තාප්පය සහ කරාපිටිය කුඹුරේ ලොට් Aද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්හතරකුත් දශම පහයි පහක් (පර්. 34.55) විශාල ඉඩම් කැබැල්ල සහ පස, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සහ මාර්ග අයිතිය ද සමග වන අතර, මෙම දේපළ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ R 114/38 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. පතිරණ විසින් මැන සාදන ලද අංක 4424 සහ 2010.10.04 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 4 වශයෙන් ලකුණ කරන ලද බෙදා වෙන්කළ බිම් කොටස මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-20

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසඩීකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2022 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| මැයි | 2022.05.06 | සිකුරාදා | 2022.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.13 | සිකුරාදා | 2022.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.20 | සිකුරාදා | 2022.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.27 | සිකුරාදා | 2022.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2022.06.03 | සිකුරාදා | 2022.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.10 | සිකුරාදා | 2022.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.17 | සිකුරාදා | 2022.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.24 | සිකුරාදා | 2022.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2022.07.01 | සිකුරාදා | 2022.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.08 | සිකුරාදා | 2022.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.15 | සිකුරාදා | 2022.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.22 | සිකුරාදා | 2022.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.29 | සිකුරාදා | 2022.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.